**AIA Insurance Lanka PLC** (Co. No. PQ 18)

Head Office
P O Box 2088
75, Kumaran Ratnam Road,
Colombo 2, Sri Lanka
T : (+94 11) 231 0310
F : (+94 11) 244 7620
E : lk.info@aia.com

AIALIFE.COM.LK

# Media Release

## මේ ඔක්තෝබර් මස AIA විශ්‍රාම මාසයයි

**2015, ඔක්තෝබර් 1 වැනිදා, කොළඹදී:** AIA මේ ඔක්තෝබර් මසදී විශ්‍රාම මාසය අරඹන්නේ ඔබේ විශ්‍රාම අරමුදලේ පරතරය කොතරම් විශාලදැයි යන පැනය පිළිබඳව විශේෂ අවධානයක් යොමු කරමිනි. සිය විශ්‍රාම දිවියේදී සැබැවින්ම කොපමණ මුදලක් අවශ්‍ය වනු ඇත්දැයි බොහෝ ශ්‍රී ලාංකිකයින් නොදන්නා අතර, ඔවුන් ඒ ගැන කිසි විටෙක සිතාබලා හෝ නැත.

බොහෝදෙනාහට විශ්‍රාමයෙන් පසු ලැබෙන විශ්‍රාම ආදායම් මට්ටම සහ සැබැවින්ම අවශ්‍ය වන ආදායම් මට්ටම අතර සැලකිය යුතු තරම් පරතරයක් පවතියි. ආයු අපේක්ෂාව වැඩි වීම, දැනට පවතින ඉතුරුම් සැලසුම් ගැන අවශ්‍ය තරමට වඩා විශ්වාසය තැබීම හෝ ප්‍රමාණවත් මුදලක් ඉතුරු නොකිරීම වැනි කරුණුවල සිට කිසිදු සැලසුමක් නොමැති වීම දක්වා වූ හේතු රැසක් මේ පරතරය සඳහා බලපායි.

මේ පිළිබඳව අදහස් දක්වමින් AIA අලෙවි ප්‍රධානී සුරේන් පෙරේරා මෙසේ පැවැසීය: ''විශ්‍රාම යන විට තමන්ට කොතරම් විශ්‍රාම අරමුදල් ප්‍රමාණයක් අවශ්‍ය වෙයිද කියන කාරණය ගැන බොහෝ අයට ඇත්තටම අදහසක් නැහැ. හැබැයි පිළිගැනීමට අකමැති වුණත් යථාර්ථය නම් විශ්‍රාමය අප සියලු දෙනාහට මුහුණ දීමට සිදුවන කරුණක් බවයි. එහෙත් බොහෝ වෙලාවට අපි ඒ සඳහා සූදනම් නැහැ. සමාජයීය වගකීමක් සහිත සමාගමක් ලෙස අපේ අරමුණ වන්නේ ශ්‍රී ලාංකිකයින් විශ්‍රාමයට සූදානම් පිරිසක් බවට පත් කිරීමයි. එය කළ හැකි එකම ක්‍රමය වන්නේ ප්‍රමාණවත් විශ්‍රාම අරමුදලක් සඳහා ඉතුරු කරන්නට, කල්තියා සැලසුම් කරන්නට පටන්ගත යුතුය යන කාරණය පිළිබඳව ජනතාව දැනුවත් කිරීම මගින් විශ්‍රාම පරතරය නැති කරගන්නට ඔවුන්ට සහාය වීමයි.''

කල්නොදමා ආරම්භ කළහොත් විශ්‍රාමයේදී ඔබ අපේක්ෂා කරන ජීවන රටාව සඳහා අවශ්‍ය ප්‍රමාණවත් මුදලක් ඉතුරු කරගන්නට ඔබට වැඩි කාලයක් ලැබෙන බව මතක තබාගන්න. ඔබේ අනාගතය සැලසුම් කිරීම ඔබේ තීරණයක් වන බැවින් එය සුවපහසු කරගැනීමේ හැකියාව ඇත්තේද ඔබටමයි. ඒ සඳහා ඔබට සහාය වීමට AIA නිබඳව කැපවී සිටියි.

විශ්‍රාම අරමුදල් පරතරය පිරවීමේ වැදගත්කම පිළිබඳව සියලු දෙනා දැනුවත් කිරීම සඳහා මේ පණිවුඩය රට පුරාම ගෙන යන්නට AIA කටයුතු කරනු ඇත. ඉමහත් කැපවීමෙන් යුතු

වෙල්ත් ප්ලෑනර්වරුන්ගේ මෙහෙයවීමෙන් ක්‍රියාත්මක වන මෙම වැඩසටහන මගින් රට පුරා විහිදී විසිරී සිටින පාරිභෝගිකයින් සහ සාමාන්‍ය මහජනතාව සක්‍රියව සම්බන්ධ කරගනිමින් ඔවුන් දැනුවත් කිරීම සිදු කෙරෙනු ඇත.

AIA විසින් සුවිශේෂී ඔන්ලයින් විශ්‍රාම ආදායම් ගණනය කිරීම් ක්‍රමයක්ද හඳුන්වා දී ඇත. මෙම ගණනය කිරීම් ක්‍රමය මගින් ඔබ අපේක්ෂා කරන විශ්‍රාමය සඳහා ඔබට අවශ්‍ය වන මුදල් ප්‍රමාණය පිළිබඳ අවබෝධයක් ඔබටම ලබාගත හැකි වන අතර, එම මුදල් ප්‍රමාණය ලබාගත හැකි ආකාරය පිළිබඳව ඔබට උපදෙස් සැපයෙනු ඇත. ඔක්තෝබර් මස 8 වන දිනට යෙදී ඇති ජාතික විශ්‍රාමිකයින්ගේ දිනයේ සිට www.aialife.com.lk වෙබ් අඩවියට පිවිසීමෙන් ඔබට අවශ්‍ය විශ්‍රාම ආදායම පිළිබඳ අවබෝධයක් ලබාගත හැකිය.

ඔබට අවශ්‍ය විශ්‍රාමය වෙත ළඟාවීම සඳහා මේ විශ්‍රාම මාසයේදී 0112310310 ඔස්සේ AIA අමතන්න,

නිමි

**මාධ්‍ය විමසීම්: සුරේන් පෙරේරා, අලෙවි ප්‍රධානී සහ සමාගම් ප්‍රකාශක**
**කාර්යාලය - 2310028, ජංගම - 0773 457959**